tamilguru.lk

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2025**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට 2025 **කොළඹ දී** පැවැත්වීමට නියමිත විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු :

වගුව - අංක 01

<table>
<tr><th>අනු. අංකය</th><th>තනතුරු නාමය</th><th></th><th>සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු ගණන</th><th>බඳවා ගන්නා ශ්‍රේණිය</th></tr>
<tr><td>01</td><td>සිතියම් තාක්ෂණ නිලධාරි</td><td></td><td>45</td><td rowspan="4">පුහුණු කිරීමේ ශ්‍රේණිය</td></tr>
<tr><td>02</td><td>ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරි</td><td rowspan="3">මෙම තනතුරුවලට අදාළ රාජකාරී කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට පමණක් සීමාවන බැවින් මුළු සේවා කාලය තුළ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු වේ.</td><td>13</td></tr>
<tr><td>03</td><td>දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි</td><td>04</td></tr>
<tr><td>04</td><td>ලිතෝ තාක්ෂණ නිලධාරි</td><td>05</td></tr>
</table>

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය:

වගුව - අංක 02

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *රාජකාරී ස්වභාවය/ ප්‍රධාන කාර්යයන්* |
|---|---|---|
| 01 | සිතියම් තාක්ෂණ නිලධාරි | තේමා සිතියම්, භූ ලක්ෂණාත්මක සිතියම්, සහ අනෙකුත් සිතියම්වල දත්ත සැකසුම, දත්ත පද්ධතිවලට දත්ත ඇතුළත් කිරීම, දත්ත පද්ධති ඇසුරෙන් සිතියම් නිෂ්පාදනය, පුණරීක්ෂණය, තත්ත්ව පාලනය, අලෙවිය ඇතුළු සිතියම් නිෂ්පාදනයට අදාළ අනෙකුත් තාක්ෂණ කටයුතු, මැනුම් පිළිබඳ කාර්යාලයීය මූලික හා අවසන් කටයුතු, මහජනයාට පිඹුරු පිටපත් නිකුත් කිරීම, ඊට අදාළ ලේඛන පවත්වාගෙන යාම, ප්‍රගති වාර්තා පිළියෙල කිරීම සහ මැනුම් දත්ත පද්ධතිවල කටයුතු |
| 02 | ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරි | ගුවන් ඡායාරූප ආධාරයෙන් පරිගණකය ආශ්‍රයෙන් සිතියම් සැකසීමට අදාළ දත්ත රැස්කිරීම |
| 03 | දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි | ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා දත්තයන්ගේ අර්ථ නිරූපණය, විශ්ලේෂණය හා එමගින් සිතියම් සැකසීමට අදාළ දත්ත රැස් කිරීම, ඒවා පරිගණකගත කිරීම, අවශ්‍ය දත්ත ලබා දීම |
| 04 | ලිතෝ තාක්ෂණ නිලධාරි | සිතියම් හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් මුද්‍රණ කටයුතු කිරීම |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප :

වගුව - අංක 03

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* |
|---|---|
| පුහුණු කිරීමේ ශ්‍රේණිය | පළමු වසර දීමනාව මාසිකව රු.41,317/-<br>දෙවන වසර දීමනාව මාසිකව රු.41,689/-<br>(රා.ප.ච.10/2025 හි උපලේඛන VI විධිවිධාන අනුව) |
| III ශ්‍රේණිය | මාසිකව රු.52,250 - 10 x 800 - 11 x 1,190 -10 x 1,320 - 10 x 1,350 - රු.100,040<br>(MN 3 – 2025) |
| II ශ්‍රේණිය | මාසිකව රු.52,250 - 10 x 800 - 11 x 1,190 -10 x 1,320 - 10 x 1,350 - රු.100,040<br>(12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(MN 3 – 2025) |
| I ශ්‍රේණිය | මාසිකව රු.52,250 - 10 x 800 - 11 x 1,190 -10 x 1,320 - 10 x 1,350 - රු.100,040<br>(23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(MN 3 – 2025) |
| විශේෂ ශ්‍රේණිය | මාසිකව රු.71,240 - 11 x 1,360 - 18 x 1,850 - රු.119,500<br>(MN 7 – 2025) |

4.0 තනතුරෙහි සේවා කොන්දේසි:-

4.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් අදාළ තනතුරු සඳහා පවත්වනු ලබන දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් සහිත තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4.2 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තනතුරු, ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතවන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ. තව ද, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

4.4 සිතියම් තාක්ෂණ නිලධාරි තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ව සිටිය යුතු ය.

4.5 තෝරා ගනු ලබන්නන් මෙම *ගැසට් පත්‍රයේ* ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළවන පොදු කොන්දේසිවලට ද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, රජය මගින් රාජ්‍ය සේවය පිළිබඳව නිකුත් කර ඇති හා කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද යටත් වේ.

4.6 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතු ය.

4.7 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුවේ.

4.8 III ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර සන්ධාන භාෂාවවන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු ය.

4.9 දෙවසරක පුහුණුව පූර්ණ වශයෙන් සම්පූර්ණ කරන බවට ද, දෙවසරක පුහුණුවෙන් පසු වසර 06ක් දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ද, සර්වේයර් ජනරාල්වරයා සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර, නිලධාරියා / නිලධාරිනිය පුහුණුව ආරම්භක දිනයෙන් පසු පුහුණුව හැර ගියහොත් හෝ ගිවිසුම්ගත කාලය දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණුව සඳහා රජයට වැයවන මුදල වන රු.150,000 ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ගෙවන බවට ද දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා ඇපකරුවන් දෙදෙනකුගේ සහතික වීම සහිතව බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කිරීමට පෙර ලියා අත්සන් කළ යුතු ය.

5.0 සුදුසුකම් :-

5.1 සියලු තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම් :

සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව යන විෂයන් දෙකක් (02) සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම;

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

5.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5.3 වෙනත්:

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

ii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි

iv. සේවයට බඳවා ගැනීම සඳහාවන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

6.0 වයස :-

6.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු
6.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.0 පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය :-

සර්වේයර් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල සහ තනතුර සඳහා පළ කරන ලද මනාපය යන කරුණු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.1 ලිඛිත විභාගය :-

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

වගුව අංක - 04

| *විෂයයන්* | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% | පැය 02 |

7.1.1 විෂය නිර්දේශය :

I. බුද්ධි පරීක්ෂණය :
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

II. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය:

<u>ගණිතය</u>

- වීජ ගණිතය (අසමානතා,විචල්‍ය, ශ්‍රේණි, ලඝු ගණක)
- ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ විසඳීම)
- සංඛ්‍යානය (මධ්‍යනාය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)

<u>භෞතික විද්‍යාව ;</u>

- ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය,දර්පන,වක්‍ර පෘෂ්ඨය, ප්‍රිස්ම,කාච, ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂ්‍ය සහ දූරේක්ෂය)
- නිව්ටන් යාන්ත්‍රික විද්‍යාව (අදිශ සහ දෛශික,චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

<u>විවිධ මාතෘකා ;</u>

- භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය)
- ඝණ වස්තුවල කෝණික දෘෂ්ටිය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.

7.2 විභාග ප්‍රතිඵල :-

අයදුම්කරුවන් වෙත විභාග ප්‍රතිඵල දැනුම් දීම සර්වේයර් ජනරාල්වරයා විසින් තැපැලෙන් හෝ www.survey.gov.lk වෙබ් අඩවිය මගින් සිදු කරනු ලැබේ.

7.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:-

සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

8.0 පුහුණු කාලසීමාව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගැනීම :

1. පුහුණු ශ්‍රේණිය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වන දෙවසරක, තාක්ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම ආයතනය මගින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරන සහතිකය ඉදිරිපත් කිරීමෙන් III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

2. පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත්වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත්වන ආධුනිකයින්ගේ තනතුර අවසන් කරනු ලැබේ.

9.0 අයදුම්පත්‍ර සකස් කිරීම හා සම්පූර්ණ කිරීම :

9.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ.මී 21 x 29(ඒ 4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. අංක 01 සිට 3.8 දක්වා ශීර්ෂ පළමු පිටුවෙහිද, අංක 04 සිට 9.1 දක්වා ශීර්ෂ 02 පිටුවෙහි ද, අංක 10 සිට 14 දක්වා ශීර්ෂ 03 පිටුවෙහි ද ඇතුළත්වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

9.2 ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්වන අතර භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොදෙන බැවින් නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.

9.3 සිංහලෙන් සහ දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

9.4 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ශ්‍රේණිගත කිරීම අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10.0 අයදුම්පත්‍ර භාර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:

10.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය, නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

10.2 ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපැලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

**10.3 *ගැසට්* නිවේදනයේ 5 ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි** යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සර්වේයර් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු.800 කි.මෙම මුදල කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය-දියතලාව වෙත ගෙවා ලබා ගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 අයදුම්පත් යොමු කිරීම :

12.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.01.16 වැනි දින හෝ ඊට පෙර** පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සර්වේයර් ජනරාල්,
විභාග අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ.පෙ.506,
කොළඹ 05.

12.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වුවන් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඉන් පෙර ඉදිරිපත් කළ යුතු වේ.

12.3 අයදුම්පත බහා එවන කවරයේ වම් පස කෙළවරේ

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ - විවෘත තරග විභාගය 2025 "** යනුවෙන් අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

*සැ.යු.* **2026.01.16** දිනෙන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාර ගනු නොලැබේ.

12.4 ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 3 හෝ 4 ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ඒ බව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් විමසිය හැක.

13.0 සාවද්‍ය තොරතුරු සැපයීම :-

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ලැබේ.

14.0 විභාගයට පෙනී සිටීම :

විභාග අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතුය. විභාග මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තවද අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය.

15.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේ දී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එන්.කේ.යූ.රෝහණ,
සර්වේයර් ජනරාල්.

2025 දෙසැම්බර් මස 05 දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
***මිනින්දෝරු දෙපාර්තමේන්තුව***

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2025**
**Open Competitive Examination for Recruitment to Training Grade Posts in Sri Lanka Technological Service - 2025**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E)
(දෙන ලද කොටුව තුළ අදාළ අක්ෂරය යොදන්න)

2.0 බඳවා ගැනෙන තනතුරු අතරින් පත්වීම ලැබීම සඳහා මනාප අනුපිළිවෙල:

වැඩිම මනාපය සහිත තනතුර සඳහා අංක 01 ද, මනාපය අඩුවන අනුපිළිවෙල අනුව අනෙකුත් තනතුරු සඳහා 02,03.... වශයෙන් අනුපිළිවෙලින් මනාප අංක සටහන් කරන්න

| තනතුරු නාමය | මනාප අංකය |
|---|---|
| සිතියම් තාක්ෂණ නිලධාරි | |
| ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරි | |
| දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි | |
| ලිතෝ තාක්ෂණ නිලධාරි | |

3.0 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම: ..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා:* PERERA A.B.C.

3.1 සම්පූර්ණ නම:..........................................................................................................
..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

3.2 සම්පූර්ණ නම:..........................................................................................................
..........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

3.3 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | |

3.4 උපන් දිනය: වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |

3.5 2026.01.16 දිනට වයස: අවු: | | | මාස: | | | දින: | | |

3.6 ස්ත්‍රී/පුරුෂ භාවය: (පුරුෂ - M ස්ත්‍රී - F) | |

3.7 විවාහක/අවිවාහක බව : විවාහක: | | අවිවාහක: | | (අදාළ කොටුව තුළ " ✓" ලකුණ යොදන්න)

3.8 ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

4.0 ස්ථිර ලිපිනය :..........................................................................................................
..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4.1 ස්ථිර ලිපිනය :..........................................................................................................
..........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

4.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..............................................................................................................................
...............................................................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

4.3 දුරකථන අංකය (තිබේනම්) : ..................................................................................................................................

5.0 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : .............................................................................................................................

5.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..................................................................................................................................
5.2 ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ......................................................................................................................................

6.0 අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතු ය)

6.1 අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය: ..................................................................................

ii. විභාග අංකය : ..........................

iii. ප්‍රතිඵලය:

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10 | |

6.2 අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය: ...................

ii. විභාග අංකය: ..........................

iii. ප්‍රතිඵලය:

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |

7.0 වෘත්තීය/තාක්ෂණික සුදුසුකම්: (අදාළ සහතිකවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය)

7.1 හදාරා ඇති උපාධිය/ පාඨමාලාව : ..........................................................................................................................
7.2 උපාධිය/පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම: ...........................................................................................................
7.3 උපාධියේ/පාඨමාලාවේ කාලය : .............................................................................................................................

8.0 වෙනත් සුදුසුකම් :

...............................................................................................................................................................................
...............................................................................................................................................................................

09. ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වැරදිකරු කරනු ලැබ තිබේද?(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

9.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න :........................................................................................................................

10.0 ඔබ මීට පෙර රජයේ /පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව:

..................................................................................................................................................................................

11.0 විභාග ගාස්තු ගෙවීම් පිළිබඳ විස්තර :

11.1 විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාල....................................................................................................................
11.2 ලදුපත් අංකය හා දිනය ..............................................................................................................................
11.3 ගෙවූ මුදල : රු........................................

| |
|---|
| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගන්න.) |

12.0 අයදුම්කරුගේ සහතිකය :

- මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අහිතකර තත්ත්වයන් විඳදරා ගැනීමට එකඟ වේ. තවද, මෙහි සියලු කොටස් සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

- මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

- තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සර්වේයර් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කර සිටිමි.

- මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :................................ ......................................................,
අයදුම්කරුගේ අත්සන.

13.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..............................................................................මයා/මිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය................................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, මම සහතික කරමි.

දිනය: ............................... ......................................................,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........................................................................................................
තනතුර : ..............................................................................................................................................
ලිපිනය: ..............................................................................................................................................
(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

14.0 දැනටමත් රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරන නිලධාරීන් සඳහා පමණක් අදාළ වේ. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය-

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති..........................................................................................................මයා/මිය/මෙය ............. ..................................දෙපාර්තමේන්තුවේ/ආයතනයේ........................... දින සිට .....................දින දක්වා ....................... ..................................................වශයෙන් සේවය කරන අතර, ඔහුට/ඇයට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත/ නැත. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක /අසතුටුදායකය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

.............................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

12 - 407